සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

9 ශ්‍රේණිය | **නර්තනය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

I - කොටස

- **සියලුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. දහවන පා සරඹයේ සරඹ නාමය වන්නේ,

(1) චක්‍ර අඩිය. (2) තුන් පැති අඩිය. (3) සුරල් අඩිය. (4) කරණම් අඩිය.

02. 'තකට තකට තක තරිකිට කුංදත් /// ගජිං'' ..... මෙය,

(1) අටවන ගොඩ සරඹයේ කස්තිරමයි. (2) හත්වන ගොඩ සරඹයේ කස්තිරමයි.

(3) නවවන ගොඩ සරඹයේ කස්තිරමයි. (4) හයවන ගොඩ සරඹයේ කස්තිරමයි.

03. ශෝකය නමැති ස්ථායී භාවයෙන් උපදින රසය වන්නේ,

(1) භයානක (2) අද්භූත (3) ශාන්ත (4) කරුණා

04. බෞද්ධාගමික මුහුණුවරක් අන්තර්ගත ගායනා විශේෂයකි,

(1) කඩතුරා කවි (2) සොකරි කවි (3) පන් නෙළීමේ කවි (4) ගොයම් කවි

05. ගැටබෙරයේ මුහුණතෙහි විශ්කම්භය,

(1) වියතකි. (2) අඩියකි.

(3) විග්ගුස්සකි. (4) තුන් වියත් තුනඟුලකි.

06. උපදේශනාත්මක කතාවක් ඇසුරෙන් නිර්මාණය වූ වන්නමකි.

(1) තුරඟා (2) සිංහරාජ (3) හනුමා (4) සැවුලා

07. ඉරහඳ පාන විල කොතැනද තුන්හිරියා..... මෙය,

(1) කුළු කවියකි. (2) සවරම් කවියකි.

(3) ලී කෙළි කවියකි. (4) පන් නෙළීමේ කවියකි.

08. ගම්පල යුගයට අයත් සංදේශ කාව්‍යක් වනුයේ,

(1) තිසර සංදේශය (2) මයුර සංදේශය

(3) පරෙවි සංදේශය (4) සැලළිහිණි සංදේශය

09. ''ගත්ත තෙහිඟු තකට තකුඳ'' මෙය,

(1) කස්තිරමකි. (2) සීරුමාරුවකි. (3) අඩව්වකි. (4) ඉරට්ටියකි.

10. සතර බීජාක්ෂර වාදනයේ දී දකුණු අතින් වාදනය වන අක්ෂර වන්නේ,

(1) තත්, ජිත් (2) තොං, නං (3) තත්, තොං (4) ජිත්, නං

- **වරහන් තුළින් තෝරා හිස්තැනට ගැළපෙන පිළිතුර ලියන්න.**

(දොං ජිජිගත, මානසික, අවකාශ, තකට, දෙවොල් මඩුව)

11. ගැමි නැටුම් නිර්මාණය කිරීමේ දී ..... භාවිතය වැදගත් වේ.

12. ..... යනු ගැට බෙරයෙන් වාදනය කරනු ලබන පළමු බෙර සරඹය යි.

13. සොකරි ගැමි නාටකයේ කවි ගායනයේ දී වැඩි වශයෙන් ..... බෙර පදය භාවිතා වේ.

14. ස්වස්ථතාවය කායික හා ..... වශයෙන් කොටස් දෙකකි.

15. පහතරට සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය ..... යි.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට පහත ප්‍රහේලිකාව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

<u>හරහට</u>

16. දක්ෂිණ භාරතීය නර්තන සම්ප්‍රදායකි

17. උඩරට නර්තන සම්ප්‍රදායේ කස්තිරම හා සමානව පහතරට නර්තනයේ පද විශේෂය මේ නමින් හැඳින්වේ.

18. උඩරට වන්නමක මෙම සත්වයාගේ හැසිරීම් රටා විස්තර වේ.

<u>පහළට</u>

19. ගැට බෙරයේ දකුණු ඇස ආවරණය සඳහා මෙය භාවිතා කරනු ලබයි.

20. භයානක රසය ඉස්මතු වන්නේ මෙම ස්ථායී භාවයෙනි.

		19 සු		
	16 හ			
				20 භ
17 ඉ		ට්		
		18 ව		

(1 x 20 = 20)

II - කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. නර්තනයේ දී මෙන් ම වාදනයේ දී සරඹ අභ්‍යාස වැදගත් වේ.
    (1) 07 සහ 09 වෙනි ගොඩ සරඹයන් හි සරඹ නාම ලියා දක්වන්න. (ල. 02)
    (2) ඔබ උගත් බෙර සරඹ දෙකක් ලියන්න. (ල. 02)
    (3) විලම්භ, මධ්‍ය, ද්‍රුත, ලය ප්‍රභේද හඳුන්වන තවත් නාමයන් 03 ක් ලියන්න. (ල. 03)
    (4) උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන්වල පාද හුරුකර ගැනීම සඳහා සිදුකරනු ලබන අභ්‍යාස හඳුන්වන නම් ලියාදක්වන්න. (ල. 03)

02. ගායනය, වාදනය ප්‍රයෝගිකව ලියා දැක්වීම ප්‍රස්තාරකරණය යි.
    (1) මාත්‍රා 3 (මැදුම් තනි තිතට) අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල. 05)
    (2) සිංහරාජ වන්නමේ කවියක් ප්‍රස්තාර කරන්න. (ල. 05)

03. පහත දැක්වෙන මාතෘකා දෙකක් පිළිබඳ විස්තර කරන්න.
    (1) සොකරි කවි (2) සතර බීජාක්ෂර
    (3) ශාරීරික ස්වස්ථතාව (4) ගැට බෙරය (ල. 5 × 2 = 10)

04. පරිසරය ඇසුරින් නර්තනය නිරමාණයේ දී ප්‍රාසාංගික නර්තනයේ විචිත්‍රත්වය දැකිය හැකිය.
    (1) නර්තන නිර්මාණයේ දී යොදාගත හැකි මිනිස් චරිත දෙකක් ලියන්න. (ල. 02)
    (2) ඔබ කැමති එක් චරිතයකට උචිත ක්‍රියාකාරකම් පෙළ ගස්වන්න. (ල. 03)
    (3) නර්තනය ඇසුරින් චරිත නිරූපණයේ දී අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 05)

05. නර්තනයේ ඉතිහාසය පිළිබඳ තොරතුරු මූලාශ්‍ර ඇසුරෙන් පැහැදිලි වේ.
    (1) අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත් සෙල්ලිපි දෙකක් ලියන්න. (ල. 02)
    (2) එක් සෙල්ලිපියකට අයත් සාධකයක් ලියන්න. (ල. 03)
    (3) සංදේශ කාව්‍ය ඇසුරින් නර්තන කලාවේ ස්වභාවය පිළිබඳ සාධකයක් ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ල. 05)

පිළිතුරු පත්‍රය - I කොටස

01	2	06	2	11	අවකාශ	16	භරත
02	3	07	4	12	තකට	17	ඉරට්ටිය
03	4	08	1	13	දොං ජිජිගත	18	වඳුරා
04	1	09	3	14	මානසික	19	සුරත්තට්ටුව
05	3	10	4	15	දොවොල් මඩුව	20	භය

(1 x 20 = 20)

II කොටස

01. (1) 7 සරඹය - අංගහාර සරඹය 9 සරඹය - දෑත පැගීමේ සරඹය (ල. 02)

(2) තකට, තකට කුඳට, තකට තකට කුඳ තකට කුජිං ජිං (ල. 02)

(3) සමගුණ, දෙගුණ, සිව් ගුණ (ල. 03)

(4) උඩරට - පා සරඹ, පහතරට - පා සරඹ, සබරගමු - මණ්ඩි පද (ල. 03)

02. (1)

´			´			´			´		
1	2	3	1	2	3	1	2	3	1	2	3
ජිං	-	ග	ත	ගො	ගො	ජිං	-	ග	ත	ගො	ගො

(ල. 05)

(2)

´				´				´				´			
1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4
+	පෙ	රත්	ක	ලෙ	ක	සි	හ	-	ර	ජෙක්	වැ	ටු	ණි	ම	හ
+	ළි	ඳක්	තු	ළ	ක	ඉ	බි	-	ල	ඩෙක්	ක	ර	පු	වැ	ඩ
+	හැ	රත්	මෙ	හෙ	ම	ය	ස	-	වැ	ඩක්	වු	ණේ	-	නැ	ත
+	වි	රත්	ක	ලෙ	ක	පැ	ව	-	තු	මක්	ය	සයි	-	හැ	ඩ

(ල. 05)

03. (1) <u>සොකරි කවි</u>

- ★ උඩරට, වන්නි ගැමි සමාජයේ ප්‍රචලිත සොකරි නාටකයේ ඇති ගායනා විශේෂයක් බව.
- ★ චරිත මුල්කොට ගෙන මෙහි ගායනා නිර්මානය කර ඇති බව.
- ★ සරල ඒකාකාරී නාද මාලාවකින් යුක්ත බව.
- ★ ආරම්භයේ සිට අවසානය දක්වා කවි ගායනා කරනු ලබන බව.
- ★ ''දොං ජිජි ගත'' බෙර පදය වාදනය කරන බව.
- ★ උඩරට ගැට බෙරය, ඌවේ දී දවුල, වන්නියේ දී උඩැක්කිය වාදනය කරන බව.
  (අදාළ කවියක් ලියා තිබීම..... ආදී කරුණු හතරක් ලියා ඇත්නම්

(2) <u>සතර බීජාක්ෂර</u>

- ★ බෙර පද, දවුල් පද සතර බීජාක්ෂර මුල්කොට ගෙන නිර්මාණය වී ඇති බව.
- ★ සාම්ප්‍රදායන් තුනෙහිම භාවිත බව.
- ★ අක්ෂර හතර නම් කර ඇත්නම්
- ★ අක්ෂර වාදනය වන ආකාරය ලියා තිබීම.
- ★ අනෙකුත් සම්ප්‍රදායන්වල දී වාදනය වන අක්ෂර ලියා තිබීම.
- ★ සතර බීජාක්ෂර මුල් කොට ගනිමින් අංගුලියා පදය වාදනය කරන බව.
  (මෙය මාතෘකාවට අදාළ වූව ද පොතෙහි අන්තර්ගත නොවූ අතිරේක කරුණකි.)

(3) <u>ශාරීරික ස්වස්ථතාවය</u>

- ★ මිනිසාගේ ශාරීරික තත්වයන් ඉක්මවා ගොස් මානසික, ශාරීරික, ආධ්‍යාත්මික සංවර්ධනය වීම හේතු කොටගෙන සුවතාවය ඇති වනබව.
- ★ පුද්ගලයෙකුගේ සිතුම් පැතුම් හැසිරීම් ගැඹුරින් නිරීක්ෂණය කිරීමෙන් ඔහුගේ මානසික ස්වස්ථතාවය හඳුනාගත හැකි බව.
- ★ ස්වස්ථතාවය සඳහා මානසික හා කායික වශයෙන් ප්‍රධාන සාධක දෙකක් බලපාන බව.
- ★ ශාරීරික ස්වස්ථතාවය පවත්වා ගැනීම සඳහා නර්තනය ඉවහල් වන බව.
- ★ ශාරීරික ස්වස්ථතාවය පවත්වා ගැනීම සඳහා ශරීරයේ නීරෝගි බව ඉවහල් වන බව ..... ආදිය

පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

(4) ගැට බෙරය

- ★ උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය බව.
- ★ යොදාගන්නා අමුද්‍රව්‍ය .... දැව, සම් වර්ග
- ★ ගැටබෙරයේ දිග, ඇසේ විෂ්කම්භය පිළිබඳව.
- ★ ගැටබෙරයේ කොටස් නම් කිරීම.
- ★ වාදනය කරන අවස්ථා ආදිය ලියා තිබීම. (ල. 5 × 2 = 10)

04. (1) ධීවරයා, කුඹල්කරුවා, ගොවියා, තේ දළු නෙළන්නිය ආදිය..... (ල. 02)

(2) එක් එක් චරිතයන්ට අදාළ ක්‍රියාකාරකම් පෙළ ගස්වා ඇති නම්..... (ල. 03)

(3)
- ★ එක් එක් චරිතවල ස්වභාවය හොඳින් නිරීක්ෂණය කිරීම.
- ★ චරිතවල ගති ස්වභාවයන් හඳුනා ගැනීම.
- ★ භාව ප්‍රකාශනය.
- ★ නර්තනය මාධ්‍ය කොට ගැනීම.
- ★ තාලය රිද්මය කෙරෙහි අවධානය යොමු කිරීම.
- ★ අවකාශ භාවිතය.
- ★ බෙර වාදනය සහ සංගීතය යොදා ගැනීම ..... ආදී කරුණු (ල. 05)

05. (1) අනුරාධපුර - සැස්සේරුව හෝ කොරවක්ගල සෙල් ලිපි (ල. 02)
පොළොන්නරු - පාලමොට්ටායි සෙල් ලිපිය, ගල් ආසන සෙල් ලිපිය

(2) සාධකයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 03)

(3) කාන්තා නර්තනය ප්‍රබලව යොදාගෙන ඇති බව හෝ භාරතීය ආභාසය යොදාගෙන ඇති බවට කවියක් උදාහරණ ලෙස ඉදිරිපත් කරමින් විස්තර කර ඇත්නම්..... (ල. 05)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

9 ශ්‍රේණිය

නර්තනය

නම/ විභාග අංකය:

ප්‍රායෝගික පරීක්ෂණය

01. (i) කැමති ගායනය. (ල. 02)

(ii) නම් කරන ගායනය (කඩතුරා, සොකරි, ගොයම්, පන් නෙළීම) (ල. 02)

(iii) කැමති බෙර පදයක් තාල තබා කීම. (ල. 02)

(iv) ඔබ උගත් බෙර සරඹයක් වාදනය කිරීම. (ල. 02)

(v) කැමති බෙර පදයක් වාදනය කිරීම. (ල. 02)

02. (i) ගුරුවරයා විසින් නම් කරන ලද පා සරඹයක් හමාර පදය සමඟ නර්තනය කරන්න. (ල. 05)

(ii) 7, 8, 9 ගොඩ සරඹ අතරින් කැමති ගොඩ සරඹයක් කස්තිරම සමඟ නර්තනය කරන්න.(ල. 05)

03. වෛරොඩි හෝ සිංහරාජ වන්නම නර්තනය කරන්න.

- ★ ගායනය (ල. 02)
- ★ මාත්‍රා නර්තනය (ල. 04)
- ★ කස්තිරම (ල. 04)

04. කළ, ලී කෙළි, කුළු, සවරං, ගොයම්, පන් නෙළීම යන ගැමි නැටුම් අතරින් කැමති ගැමි නැටුමක කවි දෙකක් ගයමින් නර්තනය කරන්න.

- ★ ගායනය (ල. 02)
- ★ උචිත චලන (ල. 04)
- ★ අවකාශ භාවිතය (ල. 04)

05. පහත චරිත වලින් ඔබ කැමති චරිතයක් නිරූපණය කරන්න.

(i) කුණාටුවකට හසු වූ ධීවරයෙක්,

(ii) වනයේ අතරමං වූ කුමරියක්

(iii) කුසගිනි වූ සිංහයෙක්

(iv) උගුලකට හසු වූ මොනරෙක්

- ★ සිද්ධි ගොඩනැගීම (ල. 02)
- ★ නර්තනානුකූල චලන (ල. 03)
- ★ භාව ප්‍රකාශනය (ල. 03)
- ★ අවකාශ භාවිතය (ල. 02)